**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 02 කොටස - 2018**

**------------------------------------------------------------------------------------------**

කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමාආයතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්/කේ දරන මූල්‍ය ගිවිසුමේ ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට කෘෂිකර්ම අමාත්‍යාංශය වර්තමානයේ කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතිය ගොවි පුහුණු සහ ධාරිතා සංවර්ධන, නවීන තාක්ෂණයෙන් යුත් කෘෂි තාක්ෂණ උද්‍යාන, නිෂ්පාදන සහ වෙළඳ පොළ යටිතල පහසුකම්, විශ්ලේෂණාත්මක සහ ප්‍රතිපත්ති උපදේශාත්මක සේවා, ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම යන උප සංරචක 05 යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,175.88 කට සමාන එජඩො මිලියන 62.87 ක් වූ අතර ඉන් රු.මිලියන 9,121.88 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමාආයතනය එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු.මිලියන 54 ක් ශ්‍රී ලංකා රජය විසින් දැරීමට තීරණය කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 17 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

**1.3. තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව ,යාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතරපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් කළමනාකාරිත්වය ව්‍යා , විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ හෝ වෙනත් පෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් ,වියදම් , වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය .

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශනමාවංචා හා වැරදි නිසා ඇතිවන ප්‍ර, ණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේකාරව විගණනය සිදු මිත ප්‍ර ලංකා විගණන ප්‍රශ්‍රී,සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්. මාණාත්මකකිරීමේදී එය සෑම විටම ප්‍රසාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත මාණාත්මකවංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍ර.අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමේන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්න්තර පාලන දුර්වලතා හා අනෙකුත් ධාන අභ්‍යප්‍ර , කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 756 | ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 105.57 ක් වූ දේපල හා උපකරණ පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සහ ප්‍රාදේශීය කාර්යාලයේ පවතින එවැනි වත්කම් වල පැවැත්ම පිළිබඳ විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වීම. | උතුරු හා උතුරු මැද ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාල වල භාණ්ඩ සමීක්ෂණය දැනටමත් අවසන් අතර ඉදිරියේදී අනිකුත් පළාත් වල සිදු කිරීමට අපේක්ෂිතය. | මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කෙරෙන දේපළ හා උපකරණ වල පැවැත්ම තහවුරු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණය පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1. ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | විගණන ගැටළුව | බලපෑම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන | ජාත්‍යන්තර සේවා සපයන්නකු බඳවා ගැනීම. | 2018 දෙසැම්බර් 31 දින වන විටත් ජාත්‍යන්තර සේවා සපයන්නකු බඳවා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වී නොතිබුණි. | කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම තුලින් ව්‍යාපෘතියේ අරමුණ වූ යහපත් කෘෂි කාර්මික පිළිවෙත් හුවමාරු කිරීම නියමිත කාලයටම සිදු නොවීම. | රේඛීය අමාත්‍යාංශය සමඟ එකඟ නොවීම. |

කළමනාකරණයේ අදහස් දැක්වීම - අදහස් දක්වා නොමැත.

විගණකගේ නිර්දේශය - යහපත් කෘෂි කාර්මික පිළිවෙත් හා දැනුම හුවමාරු කර ගැනීම සඳහා අන්තර් ජාතික සේවා සපයන්නෙකු ප්‍රසම්පාදනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

**3.2. මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ නිරීක්ෂණ**

| සේවක වර්ගය | තනතුරු සංඛ්‍යාව 2018/12/31 අනුමත | දිනට තතය | පුරප්පාඩු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ඉංජිනේරු | 05 | 04 | 01 | ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට බාධා පැමිණේ. | පහළ වැටුප් හේතුවෙන් දිගු කාලීනව ඉංජිනේරු තනතුරු පිරවීමට නොහැකි වී ඇත. පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා මූලික තනතුරු වල පුරප්පාඩු පිරවීමට වහාම කටයුතු කල යුතුය. |
| නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | - | 01 | | | |
| ප්‍රසම්පාදන විශේෂඥ | 01 | - | 01 | | | |
| මූල්‍ය කළමනාකරු | 01 | - | 01 | | | |